# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායසහ , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1552/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 07/10/2024<br>පැය 1150 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.10.06 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 80 | 555 | තඹ දඟර 02<br>යකඩ බැරල් 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය**

2024.10.06 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ වෙලේවත්ත ප්‍රදේශයේ වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 27 මිලි ග්‍රෑම් 400 ක් හා ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. පරිභෝජනය සඳහා නුසුදුසු කසල තේ සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර**

2024.10.06 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බුලත්සිංහල පොලිස් වසමේ දෙහිකඩේ හන්දිය ආසන්න ප්‍රදේශයේදී  වැටලීමක් සිදු කර පරිභෝජනය සඳහා නුසුදුසු කසළ තේ කිලෝ ග්‍රෑම් 10,360 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බුලත්සිංහල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.** බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුර.**

2024.10.06 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් නොච්චියාගම පොලිස් වසමේ රඹාවැව ප්‍රදේශයේ  වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 60 මිලි ග්‍රෑම් 830 ක්, හෙරොයින් මිලි ග්‍රෑම් 570 ක්, කේරළ ගංජා ග්‍රෑම් 172 මිලි ග්‍රෑම් 920 ක් හා ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නොච්චියාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන නොච්චියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**